# සුභාෂිතයෙන්.......

තුල සිය දිවි පුරුදු ව විසුවද නිබඳ
දුල ගුන සුදනන්ගෙ නොගනිති දනෝ දද
විල වැඩි මැඬිහු නොදනිති පියුමෙහි සුවඳ
වල බිගු ඒ මුවරඳ ගෙන මත්ව දෙති නද

**පද පිලිවෙල ගැදි-පැදියෙන් :**

සිය දිවි තුල
නිබඳ
පුරුදුව විසුවද
සුදනන්ගෙ දුල ගුන
දද දනෝ නොගනිති
විල වැඩි මැඬිහු
පියුමෙහි
සුවඳ නොදනිති
වල බිගු
ඒ මුවරඳ ගෙන
මත් ව නද දෙති.



වි ක ධර්මබන්ධු

**තේරුම:**
තම ජීවිතය මෙන් (ආදරයෙන්) නිරතුරු ව පුරුදු වී (ඒ අනුව) විසුවත්, සුදනන්ගෙ ඒ බැබලෙන (යහපත්) ගුන මෝඩයෝ අනුගමනය නොකරති; නොහොත් හොඳ බව නොපිලිගනිති. (එය හරියට) විලේ ම හැදී වැඩුනු මැඬියන් (ඒ විලේ පිපෙන) නෙලුම් මලේ (මල්වල) සුවඳ නොදැනීමත්, කැලේ වසන මී මැස්සන් (එහි පැමින) ඒ (නෙලුම් මල්වල) රොන් උරා බී මත් වී (සතුටු වී) නාද කිරීමත් වැනිය.

*'මුවරඳ' යන්න 'මකරන්ද යන්නෙන් බිඳී ඇති බව කියති. මකර-මුවර-(මෝර) වේ. මකර-න්ද, මුවර-ඳ වේ. සමහරු මෙහිද නැහැසිය හලා 'මුවරද' යනුවෙන් ලියති.*

විසිතුර * තුල - තුලාව (තරාදිය) ඇසුරින් ගත් වචනයකි. සමානව / මෙන් යන තේරුම දීම සඳහා එය ගෙන ඇත.

* දුල ගුන - ඉදු බව හෙවත් අවංක කම, කියන දේ කරන-කල දේ කියන ගතිය කෙනෙකුගේ දුල (බැබලීට හේතු වන) ගුනය්. උදුල යන්නේ 'උ' ලොප් කිරීමෙන් 'දුල' හැදේ. අනත යන්-න් 'අ' ලොප් කිරීමෙන් 'නත' හැදෙන්නේත් මේ විදියටමය්. උතුම් යන්න 'තුම්' වීමත් උතුමා යන්න 'තුමා වීමත් ඒ අනුවම හැදී ඇත. දුල ගුන යනු යහපත් උතුම් ගුනය්.

* මැඬීහු - සමහරු මෙහි නැහැයි හඬ මරා 'මැඩිහු / මැඩියෝ' යනුවෙන් ලියති; කියති. මඬ, මඬු, කඬ, මඟ එබඳු තවත් වචන කිහිපයකි. හඬ, පිඬු, දඬු, අඬු, යන වචනවලට එය බල පා නැත. -දියෙහි යන දන්ඩටදු යන තැන 'දණ්ඩ' යන්න 'දන්ඩ' වී ඇත. අඬු/අන්ඩ, දඬු/දන්ඩ වී ඇතත් බඬු/බන්ඩ වී නැත. ගැටවරයන් බඩුව/බඩ්ඩ යනුවෙ-න් හඳුන්නන්නේ කෙල්ලන්ය.

සිය බසේ ණ්, ළ් හල් කිරීමේ සිරිතක් නැති නිසා තෙන්නකෝන් කිවිසුරානන් 'දියැ හි යන දඬට' යනුවෙන් ලියා ඇත. එහෙත් මුල් ලියවිලි වෙනස් කොට සුදු කිරීම නොකල යුතුය යනු මගේ ඇඟීමය්. 'ස්වේත' සිංහලට බිඳෙන්නේ (සේසත) 'සේ' යනුවෙනි; 'ශුද්ධ' සිංහලට බිඳෙන්නේ (පිරිසුදු) 'සුදු' යනුවෙනි. එහෙත් අද 'සේ' වෙනුවට 'සුදු' පැමින ඇත. මැඩි යන්න 'මණ්ඩුක' යන්නෙන් සහ 'මුවරඳ' යන්න 'මකර-න්ද යන්නෙන් බිඳී ඇති බව කියති. මකර-මුවර-(මෝර) වේ. මකර-න්ද, මුවර-ඳ වේ. සමහරු මෙහිද නැහැසිය හලා 'මුවරද' යනුවෙන් ලියති. මේ කවියේ මැඩියන් මෝඩ මිනිසුන් ලෙස දක්වා ඇතත් මී මැස්සන් ලෙස දැක් වූ කිසිවෙක් නැත.

# සිසිරය උණුසුම් කරන්නට බී ෂාප් සැරසෙයි

## ජූලි 24 "නයිට් විත් බී ෂාප්"



වසර දොළහක් තිස්සේ මෙල්බන් රසික රසිකාවියන් පිනවමින් සංගීත ලෝකයේ අපූරු වැඩ කරන්නට පෙරමුණ ගත් බී ෂාප් සංගීත කණ්ඩායම තවත් අමතක නොවන අත්දැකීමක් ඉදිරිපත් කරන්නට සැරසෙයි. සංගීත කණ්ඩායමේ නියාමක රොෂාන් ලින්තොටගේ සමග උද අපි මුහුණට මුහුණෙන් කතා කරමු.

*ශ්‍රීනාත්*
මොකක්ද රොෂාන් මේ සංගීත ප්‍රසංගය

*රොෂාන්*
ඇත්තටම අපි කවුරුත් දන්නවා මේ කාලයේ අපි බොහෝ වෙලාවට අධික සීතල නිසා ගෙවල් ඇතුළට වෙලානෙ ඉන්නෙ. ඉතින් අපි හිතුවා ශීත කාලය ටිකක් උණුසුම් කරන්නට අලුත් මාදිලියේ සංගීත ප්‍රසංගයක් වගේම සියලු දෙනාටම එකතු වී රිසි සේ විනෝද වන්නට අවස්ථාවක් ලබා දෙන්නට. තවත් හේතුවක් තමයි අපේ සංගීත කණ්ඩායමට මේ වසරේ අවුරුදු 12 පිරීම. මගේ සංගීත දිවියටත් අවුරුදු 20 විතර වෙනවා. ඒ නිසා මේ සියල්ල වෙනුවෙන් තමයි නයිට් විත් බී ෂාප් සංගීත ප්‍රසංගය පවත්වන්නෙ.

*ශ්‍රීනාත්*
මේ ප්‍රසංගය මොන අයුරින්ද ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙන්නෙ?

*රොෂාන්*
මම මුලිනුත් කිව්වනෙ මේක අමුතුම මාදිලියෙ ප්‍රසංගක් බව. ඒ නිසා අපි එදාට එකතු වෙලාම බලමු. මම විශේෂයෙන්ම මතක් කරන්න ඕනෙ මේ ප්‍රසංගයෙදි ප්‍රවීණ ගායන ශිල්පි රනිල් මල්ලවාරච්චි සමග් ප්‍රවීණ ගායක ගායිකාවන් කීප දෙනෙක්ම හමුවෙන්න පුලුවන්. ඒ වගේම අපි කවදත් ආදරය කරන 70 දශකයේ ජනප්‍රිය ගීත රැසක්ද සියලු දෙනා සමගින් එක්වී ගයන්නට වයන්නට තමයි අපේ වෑයම. ඒ එක්කම එතනින්ම රාත්‍රි භෝජනයද ලබා ගන්න පුලුවන් .

*ශ්‍රීනාත්*
ඔබ හැමවිටම අලුත් යමක් කරන්න සූදානම් වෙන සංගීත කණ්ඩායමක් මොනවද ඔබේ ඉදිරි සැළසුම්?

*රොෂාන්*
අපි බලාපොරොත්තු වෙනවා මේ වසර අවසා-නයේදී මෙල්බන් නුවර ප්‍රථම වතාවට සංගීත කණ්ඩායමක් ඔවුන්ගේ ගීත පමණක් ඉදිරිපත් කරන සංගත තැටියක් ඉදිරිපත් කරන්නට. බී ෂාප් සංගීත කණ්ඩායමේ ස්වතන්ත්‍ර නිර්මාණ ඇතුළත් සංගත තැටිය දැන් අපි සූදානම් කරමින් තිබෙනවා.

*ශ්‍රීනාත්*
ඔබ මීට වසර ගණනාවකට පෙර ඉතා සාර්ථකව කළ මෙපුර ගී වැනි ප්‍රසංගයක් නැවත කරන්නය බලාපොරොත්තුවක් නැද්ද?

වසර ගණනාවක් ගිහිල්ලත් තවම ඔබට ඒ ප්‍රසංගය මතක තිබීම ගැන මම සතුටු වෙනවා. මම මෙපුර ගී ප්‍රසංගය සැළසුම් කළේ අපිත් එක්ක එකට ඉන්න අපේ අයගේ නිර්මාණ මෙල්බන් වෙසෙන රසිකයන්ට ලබා දීමටත් මෙහි ඉන්න ගායක ගායිකාවන් සැම එකම තැනකට ගෙන ඒමත් තමයි මගේ අදහස වුණේ. මම හිතනවා මට අවශ්‍ය වූ දේ කරන්නට හැකි වුණා කියලා. අපි පුරුදු වෙලා ඉන්නවා අපි අතර ඉන්න දක්ෂයන් අඩු තක්සේරුවකට දමන්න. ඒ මිත්‍යාව නැති කරන්න මට අවශ්‍ය වුණා. මං හිතන්නෙ එය සාර්ථක වුණා කියලයි ඒ එක්කම මගේ සංගීත කණ්ඩායමත් සමග මෙපුර ගී ප්‍රසංගයට නො-දෙවෙනි ප්‍රසංගයක් කරන්න මම බලාපොරොත්තු වෙනවා. එදාට මෙහි ගායක



ගායිකාවන් ශ්‍රී ලංකාවේ ජනප්‍රිය ගායක ගායිකාවන් සමග එකම වේදිකාවක ගී ගයාවි.

*ශ්‍රීනාත්*
කවුද මේ ප්‍රසංගය රසවත් කරන්නට ඔබත් සමග එක්වන ඔබේ ශිල්පීන්?

*රොෂාන්*
මාත් සමග රවි ප්‍රනාන්දු, සසංක ප්‍රනාන්දු, ශම්මි හේරත්, මනෝජ් දලුවත්ත, අශේන් උවේන්ද්‍ර, උදිත ඩි මෙල් සම්බන්ධ වෙනවා ඒ වගේම මේ ප්‍රසංගය සිනාවෙන් පිරි ප්‍රසංගයක් කරන්නට ප්‍රවීණ ශිල්පීන් කිප-දෙනෙක්ම සහභාගි වෙනවා.

*ශ්‍රීනාත්*
ප්‍රසංගය පැවැත්වෙන තැන?

*රොෂාන්*
ජූලි 24 වන දා වීලස් හිල් හි ගුඩ් ෂෙපඩ් පැරිස් හෝල් හිදී තමයි ප්‍රසංගය පැවැත්වෙන්නෙ. ලිපිනය නො 30 ඇකඩමි ඇවනියු වීලර්ස් හිස්

*ශ්‍රීනාත්*
මේ ප්‍රසංගය ගැන වැඩිදුර විස්තර අවශ්‍ය අයට

*රොෂාන්*
මගේ දුරකතනයට කතා කරන්න පුලුවන් 0412 540 006

රොෂාන් සමග බි ෂාප් කණ්ඩායම පැමිණි මේ ගමන තවත් ඉදිරියට යන්නට සහ නව මාදිලියේ නිර්මාණ එළි දක්වන්නට ශක්තිය හා ධෛර්යය ලැබේවා යි සන්නස වෙනුවෙන් අපි ප්‍රාර්ථනා කරනවා.

